ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. CAE/D/CECB/02/FS/2024/02    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2025 ජුනි 30 දින

සභාපති

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය

**ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ සහ එහි පරිපාලිතයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ ("කාර්යාංශය") සහ එහි පරිපාලිතයේ ("සමූහය") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හා අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තරකර ඇති කරුණු වලින් වන බලපෑම හැර, කාර්යාංශයේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒවායේ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### 1.2.1 මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්ගලික) සමාගම

පහත නිරීක්ෂණ මත පදනම්ව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගමේ (පරිපාලිතයේ) මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කරන ලදී.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව දේපල, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු අතර සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 2.3.6 අනුව ද සමාගම විසින් වාර්ෂිකව දේපල පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ආයුකාලය සමාලෝචනය කරන බව සඳහන් වුවද, 2024 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද පිරිවැය රු.මිලියන 883.88ක් වූ දේපල පිරියත හා උපකරණවල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය නැවත තක්සේරු කිරීමකින් තොරව සහ ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 08ට අනුකූලව ඇස්තමේන්තු වෙනස්කම් නිවැරදි කරමින් හා නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමකින් තොරව සමාගම විසින් එම වත්කම් අඛණ්ඩව භාවිතා කරමින් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් යටතේ දක්වා තිබුණු රු.මිලියන 2.74ක වත්කම් අපහරණ ලාභය තුළ පෙර වර්ෂවල අපහරණයන්ට අදාළ අධි ක්ෂය ගැලපීම් (Adjustment of Over - depreciated amount in disposal from previous years) රු.මිලියන 1.69ක් ඇතුළත් කර තිබීමෙන් වර්ෂයේ වෙනත් ආදායම් එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.

(ඇ) සමාගම විසින් සමාගමේ මව් ආයතනයට පිළිවෙලින් රු.මිලියන 62.16ක් හා රු.මිලියන 2,242.95ක් ගෙවිය යුතු වෙළඳ ණයහිමියන් හා ගෙවිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස හඳුනාගෙන තිබුණි. මව් ආයතනය විසින් ඔවුන්ගේ ගිණුම්වල ලැබිය යුතු වෙළඳ ණයගැතියෝ හා ලැබිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස පිළිවෙලින් රු.මිලියන 53.20ක් සහ රු.මිලියන 2,239.57ක් හඳුනාගෙන තිබුණි. ඒ අනුව සමාගමේ හා මව් ආයතනයේ මූල්‍ය ප්‍රකාශනයන්හි වෙළඳ ණයගැති/ ණයහිමි සහ ලැබිය යුතු/ ගෙවිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ශේෂයන්හී පිළිවෙලින් රු.මිලියන 8.96ක සහ රු.මිලියන 3.37ක වෙනසක් පැවතුණි.

(ඈ) 2024 ජනවාරි මාසයේ පැවති වාර්ෂික තොග සහ වත්කම් සත්‍යාපනයේදී දකුණු පළාතේ ගාල්ල හා මාතර යන ව්‍යාපෘති ඒකක 03ට අයත් තොග සහ වත්කම් අයිතම රාශියක අතිරික්තයක් ඇති බවත් වෙන්දේසි කිරීම් හා වෙනත් කාර්යයන් මගින් ඉවත් කළ ස්ථාවර වත්කම් ව්‍යවසාය සම්පත් සැලසුම් (ERP) පද්ධතිය තුළ තවදුරටත් පවතින බවත්, වත්කම් අයිතම කිහිපයක ඌණතා

පවතින බවත් අනාවරණය වී තිබුණි. කෙසේ වෙතත් එම අතිරික්තතා හා ඌණතාවල මූල්‍යමය වටිනාකම වාර්තා කරන දිනය වන විටත් එම පද්ධතිය තුළ ගැලපුම් කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි.

(ඉ) සමාගමේ වෙළඳ ගෙවිය යුතු දෑ, ගෙවිය යුතු රඳවාගැනීම් සහ වෙළඳ ලැබිය යුතු දෑ පිළිබඳ විස්තරාත්මක උපලේඛන අනුව පිළිවෙලින් රු.මිලියන 64.85ක්, රු.මිලියන 28.42ක් සහ රු.මිලියන 26.54ක් සමාගම නමින්ම ඇතුළත් කර තිබුණි. ඒ අනුව ආයතනයේ අභ්‍යන්තර ඒකක අතර සිදුවන ගනුදෙනු අවසාන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සැසඳීම්කර හා නිවැරදිකර මූල්‍ය ප්‍රකාශන සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සඳහා කළමනාකාරීත්වය විසින් අවධානය යොමුකර නොතිබුණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී සමාගමේ මූලික කාර්යාල අතර සිදුවූ අභ්‍යන්තර ගනුදෙනු ඉවත් කිරීම සිදුකල යුතු වුවත් රු.මිලියන 27.71ක අභ්‍යන්තර ගණුදෙනු වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කිරීමෙන් ආදායම එම ප්‍රමාණයෙන් අධි ගණනය වී තිබුණි.

(උ) 2023 පෙබරවාරි 28 දින ශ්‍රී ලංකා හදබිම අධිකාරිය සමඟ ඒකාබද්ධව කුකුල් අභිජනන ව්‍යාපෘතියක් සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන්කර 2025 අප්‍රේල් මස 09 දින ඒකාබද්ධ ව්‍යාපාර ගිවිසුමකට (Joint venture agreement) එළඹ තිබුණි. ගිවිසුම අනුව පළමු වසර 06 තුළ අදාළ කොන්දේසි යටතේ ශුද්ධ ලාභයෙන් සියයට 70ක් සමාගමට හා සියයට 30ක් අධිකාරියට ලෙස ලාභ බෙදාගැනීමට එකඟ වී තිබුණි. හදබිම අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු.මිලියන 3.56ක ශුද්ධ ලාභයක් උපයා තිබුණද ගිවිසුම් ප්‍රකාරව සමාගම වෙත ලාභ බෙදීමක් සිදුව නොතිබුණි. තවද සමාගම වෙත ලැබිය යුතු ලාභ මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගෙන නොතිබුණු අතර මේ දක්වා සමාගම විසින් මෙම ව්‍යාපෘතිය සඳහා දරන ලද පිරිවැය එකතුව රු.මිලියන 87.39ක් පමණක් කෙරීගෙන යන වැඩ ලෙස සමාගමේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමටද කටයුතු කර නොතිබුණි.

### 1.2.2 ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව දේපල, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු අතර කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 3.8 අනුව ද සමාගම විසින් වාර්ෂිකව දේපල පිරියත සහ උපකරණවල ප්‍රයෝජනවත් ආයුකාලය සමාලෝචනය කරන බව සඳහන් වුවද, 2024 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද පිරිවැය රු.මිලියන 419.92ක් වූ දේපල

පිරියත හා උපකරණවල ප්‍රයෝජනවත් ආර්ථික ආයු කාලය නැවත තක්සේරු කිරීමකින් තොරව සහ ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 08ට අනුකූලව ඇස්තමේන්තු වෙනස්කම් නිවැරදි කරමින් හා නිවැරදි ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමකින් තොරව කාර්යාංශය විසින් එම වත්කම් අඛණ්ඩව භාවිතා කරමින් පැවතුණි.

(ආ) ව්‍යාපෘති 10 ක් වෙනුවෙන් රාජ්‍ය ආයතන 8 කින් කාර්යංශයට ලැබිය යුතු එකතුව රු. මිලියන 14.85 ක පැරණි ශේෂයක් වැරදි නිවැරදි කිරීම් ලෙස සමාලෝචිත වර්ෂයේ ලාභයෙන් කපා හැරීමට කටයුතු කර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අවප්‍රමාණය වී තිබුණි.

(ඇ) පරිපාලිත සමාගම විසින් රු.මිලියන 62.16ක් හා රු.මිලියන 2,242.95ක මුදලක් පිළිවෙලින් කාර්යාංශයට ගෙවිය යුතු වෙළඳ ණයහිමියන් සහ ගෙවිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස හඳුනාගෙන තිබුණු අතර කාර්යංශය විසින් ඔවුන්ගේ ගිණුම්වල පිළිවෙලින් ලැබිය යුතු වෙළඳ ණයගැතියෝ සහ ලැබිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු.මිලියන 53.20ක් සහ රු.මිලියන 2,239.57ක මුදලක් පමණක් හඳුනාගෙන තිබුණි. ඒ අනුව කාර්යාංශයේ සහ පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රකාශනයන්හි මෙම ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂයන්වල පිළිවෙලින් රු.මිලියන 8.96 ක් සහ රු.මිලියන 3.38ක වෙනසක් පැවතුණි.

(ඈ) නියැදි පරීක්ෂාවකට අනුව කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශනයේ ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලය, තහනම් උත්තේජක නිවාරණ නියෝජිත ආයතනය සහ ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය යන ආයතනයන්හි ඉදිකිරීම් ව්‍යාපෘති 12කට අදාලව ණයගැති ශේෂය රු.මිලියන 140.29ක් වුවද, එම ආයතන 03හි විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව කාර්යාංශය වෙත ගෙවිය යුතු ණයහිමි ශේෂ එකතුව රු.මිලියන 42.14ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ශේෂ අතර රු.මිලියන 98.15ක වෙනසක් නිරීක්ෂණය විය. එසේම සමාලෝචිත වර්ෂය අවසානයට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය යන ආයතනයන්හි උපදේශන සේවා ව්‍යාපෘති 40කට අදාලව එකතුව රු.මිලියන 64.87ක ලැබිය යුතු ශේෂයක් කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද, එම ආයතන 02හි මූල්‍ය ප්‍රකාශනවල කාර්යාංශය වෙත ගෙවිය යුතු ණයහිමි ශේෂයක් ඇතුළත්ව නොතිබුණි. මේ අනුව අදාළ ආයතන සමග සැසඳීමේදී ඉදිකිරීම් හා උපදේශන සේවා ණයගැති ශේෂයේ රු.මිලියන 163.01ක සමස්ථ වෙනසක් නිරීක්ෂණය විය. තවද, මෙම ණයගැති ශේෂ තහවුරු කිරීම සඳහා ශේෂ සනාථන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 සමූහයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් සමූහයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමූහයේ 2024 වාර්ෂික වාර්තාවන් කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කල යුතුය. තවදුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඇවර කිරීමට අදහස්

කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරනු ලබන විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- කාර්යාංශයේ හා සමූහයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තිරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, සමූහයේ අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතන හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගන්නා ලදී.සමූහ විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්ය සාධනය සඳහා මා වගකිව යුතුය. මගේ විගණන මතය සඳහා මම සම්පූර්ණයෙන්ම වගකිව යුතුය.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා

විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමූහය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2.2 (අ), (ඈ) දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කාර්යාංශය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | **නීතිරීති / විධානයට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|---|
| (අ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 83 වගන්තිය, 2006 අංක 10 ද දරන දේශීය ආදායම් පනතේ 114 වගන්තිය හා 2002 අංක 14 දරන එකතු කල අගය මත බදු පනතේ 26 (1) වගන්තිය | 2009 දෙසැම්බර් 31 දිනට එකතු කල අගය මත බදු (VAT) හා උපයන විට ගෙවීම් බදු (PAYE) යනාදී වශයෙන් එකතුව රු. මිලියන 24.94 ක හිඟ බදු මුදලක් හා ඒ මත අයකරන ලද එකතුව රු. මිලියන 33.89 ක දඩ මුදලක් ලෙස මුළු එකතුව රු.මිලියන 58.83ක් කාර්යාංශය විසින් ගෙවීම් පැහැර හරින ලද බදු ලෙස පවතින බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2024 සැප්තැම්බර් 18 දින තහවුරු කර තිබුණි. කෙසේ වෙතත් 2025 මැයි 31 දිනට විගණනය වෙත ඉදිරිපත් |

| | | |
|---|---|---|
| | | කරන ලද තොරතුරු අනුව ඉහත බදු මුදලින් හිඟ බදු හා දඩ මුදල් එකතුව රු. මිලියන 42.07ක ශේෂයක් තවදුරටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතුව පැවතුණි. |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දෙන ලද රජය සතු ව්‍යාපාර සඳහා වන මෙහෙයුම් අත්පොත | |
| (i) | 3.2 හා 3.4 ඡේද | කාර්යාංශයේ මධ්‍යම කළමනාකරණ මට්ටම හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම් සඳහා අනුමත බඳවා ගැනීම් පරිපාටියක් සහ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ සැලැස්මක් 2025 මාර්තු 31 දින වන විටත් සකස් කර අනුමත කරවා ගෙන නොතිබුණි. |
| (ii) | 6.8 ඡේදය | අමාත්‍යාංශ සහ අනෙකුත් ආයතන තම කාර්යයන් ඉටු කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාරවල සම්පත් භාවිතා නොකළ යුතු වුවත් කාර්යාංශය විසින් 1990 වර්ෂයේදී රු.මිලියන 3කට මිලදී ගෙන තිබූ කොළඹ ටී.බී. ජයා මාවතේ (ඩාලි පාරේ) පිහිටි රූඩ් 02 පර්චස් 24.5ක ඉඩම වාරිමාර්ග අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යාලයේ රථගාල සඳහා කිසිදු අයකිරීමකින් තොරව භාවිතා කරමින් පවතී. |

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

## 2.3 වෙනත් කරුණු

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව 2023 සහ 2024 වර්ෂවල ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් (EPC) අංශයේ මෙහෙයුම් ලාභය පිළිවෙලින් රු.මිලියන 74.73ක් සහ රු.මිලියන 86.49ක් වුවද, එහි ඇති අංශ 13න් 7ක සමාලෝචිත වර්ෂය සඳහා එකතුව රු.මිලියන 34.34ක මෙහෙයුම් අලාභයක් තිබුණි.

(ආ) ඉදිරිපත් කරන ලද උපදේශන අංශයේ මූල්‍ය ප්‍රකාශනයට අනුව සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 72.50ක මෙහෙයුම් ලාභයක් වාර්තා කර තිබුණද, එහි ඇති අංශ 20න් 8ක එකතුව රු.මිලියන 130.47ක මෙහෙයුම් අලාභයක් තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පරිපාලිත සමාගමෙන් රු.මිලියන 1,569.4ක් කාර්යාංශයට ලැබිය යුතුව පවතින අතර මේ සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර නිසි සහ යාවත්කාලීන ගිවිසුම් පවත්වා ගෙන ගොස් නොතිබුණි. තවද මෙම ශේෂය නිරවුල් කිරීමට හෝ ආයතනයන්හි ඉදිරි ගනුදෙනු මෙහෙයවීම සම්බන්ධයෙන් කිසිදු ඵලදායි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර 2017 වසරේ සිට අඛණ්ඩව මෙම ශේෂය ඉහළ ගොස් තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයේ කාර්යාංශය වෙත අයවිය යුතු මුළු ණයගැති ශේෂය රු.මිලියන 5,188.58ක් වූ අතර එහි ඇතුළත් ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් (EPC) අංශයේ වර්ෂ 3–5 අතර ණයගැති ශේෂයන් සහ වර්ෂ 5 ඉක්මවූ ණයගැති ශේෂයන් පිළිවෙලින් රු.මිලියන 200.29 ක් සහ රු.මිලියන 1342.39ක් ද උපදේශන අංශයේ වර්ෂ 3–5 අතර සහ වර්ෂ 5 ඉක්මවූ ණයගැති ශේෂයන් පිළිවෙලින් රු. මිලියන 658.45ක් සහ රු.මිලියන 130.94ක් ද විය. ඒ අනුව කාර්යාංශයට ලැබිය යුතු ණයගැති මුදල් කාලීනව එකතු කර ගැනීමට විධිමත්ව කටයුතු කර නොතිබුණු අතර, එමෙන්ම ණයගැති ශේෂ සනාථන ලියවිලි විගණනය වෙත ඉදිරිපත් නොකල බැවින් ණයගැති ශේෂයන්හි පැවැත්ම සහ වටිනාකම සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට ද නොහැකි විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය ආයතන 3 කින් ලැබිය යුතු රු. මිලියන 40.99 ක ශේෂයක් අයකර ගැනීමට විධිමත් පියවරක් නොගෙන හානිකරණ අලාභ ලෙස වෙන්කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයේ මුළු ණයහිමි ශේෂය රු.මිලියන 2,103.68ක් වූ අතර එහි ඇතුළත් ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් (EPC) අංශයේ වර්ෂ 3–5 අතර ණයහිමි ශේෂයන් සහ වර්ෂ 5 ඉක්මවූ ණයහිමි ශේෂයන් පිළිවෙලින් රු.මිලියන 162.76ක් සහ රු.මිලියන 696.83ක් ද උපදේශන අංශයේ වර්ෂ 3–5 අතර ණයහිමි ශේෂයන් සහ වර්ෂ 5 ඉක්මවූ ණයහිමි ශේෂයන් පිළිවෙලින්

රු.මිලියන 3.89ක් සහ රු.මිලියන 40.08ක් ද විය. ඒ අනුව කාර්යාංශය විසින් ණයහිමි ශේෂ කාලිනව පියවීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(උ) කාර්යාංශයට අයත් පරිපාලිත සමාගමේ අනුරාධපුර මෙහෙයුම් කාර්යාලයේ 2016 ජනවාරි 01 සිට 2020 ජුනි 22 දක්වා සිදුව ඇතැයි සැලකෙන විෂමාචාරයන් හේතුවෙන් පරිපාලිතයේ විධායක නිලධාරියෙකු 2021 ජනවාරි 11 දින සිට වැඩ තහනමකට ලක් කර තිබුණු අතර කාර්යාංශයේ සභාපතිවරයා විසින් 2021 මැයි 24 දිනැති ලිපියෙන් අදාළ නිලධාරියා වැඩ තහනමට ලක් කළ දිනය වූ 2021 ජනවාරි 11 දින සිට බලපැවැත්වෙන පරිදි කාර්යාංශයේ සේවකයකු ලෙස නැවත සේවයේ පිහිටුවා තිබුණි. ඒ සම්බන්ධයෙන් කාර්යාංශය හෝ පරිපාලිත සමාගම කිසිදු විමර්ශනයක් සිදු නොකිරීම, තවදුරටත් මූල්‍ය අක්‍රමිකතා හා අවභාවිතාවන් සඳහා හේතුවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඌ) කාර්යාංශය විසින් කාලානුරූපව ව්‍යාපෘති පසුවිපරම් කර රඳවාගැනීම් මුදල් නිදහස් කර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බැවින් සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.මිලියන 2,712.45ක ලැබිය යුතු රඳවා ගැනීම් ශේෂය තුල වසර 3 සිට 5 දක්වා රු.මිලියන 691.21ක් ද, වසර 05ට වැඩි රු.මිලියන 944ක්ද පැවතුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසානයට ජංගම වගකීම් යටතේ පෙන්වනු ලබන ගෙවිය යුතු රඳවා ගැනීම් (Retention Payable) ශේෂය රු.මිලියන 2,392.75ක් වූ අතර විගණනයට ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව මෙම ගෙවිය යුතු රඳවා ගැනීම් ශේෂය තුළ වසර 3 සිට 5 දක්වා වූ රු.මිලියන 756.86ක් ද, වසර 05ට වැඩි රු.මිලියන 574.52ක්ද නිරවුල් කර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු හා ගෙවිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් (Mobilization Advance) පිළිවෙලින් රු.මිලියන 2,245.99 ක් හා රු.මිලියන 2,643.84ක් වූ අතර එහි ඇතුළත් වසර 05ට වැඩි ලැබිය යුතු හා ගෙවිය යුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් පිළිවෙලින් රු.මිලියන 643.07ක් හා රු.මිලියන 718.53ක් මේ දක්වා නිරවුල් කර නොතිබුණි.

(ඔ) කාර්යාංශය සතු වාහන 43 ක් භාවිතයට නොගෙන විවිධ ස්ථානවල ගාල් කර ඇති අතර ඒවා අලුත්වැඩියා කර භාවිතයට ගැනීම හෝ අපහරණය කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂය තුළ කාර්යාංශයේ සේවයේ නියුතු වෘත්තිකයින් 186 දෙනෙකු සඳහා තම පෞද්ගලික වාහන භාවිතා කර තම වාසස්ථානයේ සිට කාර්යාලය වෙත යෑම සහ ඒම වෙනුවෙන් භාණ්ඩාගාර අනුමැතිය රහිතව 2011දෙසැම්බර් 22 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත එකතුව රු.මිලියන 29.90ක් ප්‍රවාහන දීමනා ලෙස ගෙවීම් කර තිබුණි.

(ක) වැටුප් රහිත නිවාඩු මත විදේශගතවීම් වෙනුවෙන් කාර්යාංශය සමඟ නිළධාරීන් 13 දෙනෙකු එකතුව රු.මිලියන 17.08ක බැඳුම්කර ගිවිසුම් ඇතිකර ගෙන තිබුණු අතර බැඳුම්කර ගිවිසුම් කඩකල නිළධාරීන් 08 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.මිලියන 6.56ක් අයකර ගැනීමට කාර්යාංශයට නොහැකි වී තිබුණි.

(ඛ) කාර්යාංශයේ ඉංජිනේරු ප්‍රසම්පාදන ඉදිකිරීම් අංශයට (EPC) අයත් මූලික කාර්යාල 12 ක් විසින් පරිපාලිත සමාගමේ මූලික කාර්යාල වෙත අවස්ථා 15 කදී තාවකාලික ණය (Temporary loans) ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට පැවති රු.මිලියන 766.34ක මුළු ණය මුදල තුළ එකතුව රු.මිලියන 526.80ක් වසර 2 සිට 4 දක්වා ද එකතුව රු.මිලියන 260.14ක් වසර 5 ක් ඉක්මවාද අයවිය යුතුව පැවතුණි. මෙම ණය මුදල් සම්බන්ධයෙන් පොලී මුදලක් අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණු අතර ණය ආපසු අයකර ගැනීමේ සැලැස්මක්ද සකස් කර නොතිබුණි.

ජී. එච්. ඩී. ධර්මපාල
විගණකාධිපති (වැ.බ)